# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2025

**10 ශ්‍රේණිය** | **ගෘහ ආර්ථික විද්‍යාව - II**

නම/ විභාග අංකයඃ ........................................ කාලය පැය 02 යි

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. තවත් ප්‍රශ්න හතරක් තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01) මව, පියා හා දරුවන් තිදෙනෙක් සිටින පවුලක මව රැකියාවක් නොකර අතර පියා පෞද්ගලික ව්‍යාපාරයක හිමිකරුවෙකි. පාසල් යන වයසේ දරුවන් දෙදෙනෙක් සිටින මෙම පවුලේ බාලම දියණියට වයස මාස 4ක් පමණ වේ. නාගරික ප්‍රදේශයක ජීවත් වන මොවුන්ගේ නිවසේ ගෘහණියගේ සහායට කාන්තාවක් ද සිටියි. ඇය නිවසේ කටයුතු වලට මනා සහායක් ලබා දේ. ප්‍රීතිමත් පවුලක් වන මොවුන්ගේ දෙවන දියණියගේ උපන් දිනය මෙම මාසයට යෙදී තිබේ.

i. (අ) මෙහි දැක්වෙන පවුල් වර්ගය කුමක්ද?
(ආ)එය හඳුන්වන වෙනත් නමක් ලියා දක්වන්න.
ii. මෙම පවුලේ දක්නට ලැබෙන ලක්ෂණ දෙකක් ලියන්න.
iii. පළාත් පාලන ආයතනය මගින් ලැබෙන යටිතල පහසුකම් දෙකක් නම් කරන්න.
iv. ගෘහණිය සතු මානව සම්පත් දෙකක් නම් කරන්න.
v. කුඩා දරුවන්ට වඩාත් අවශ්‍ය වන ආහාර මගින් ලබා දිය යුතු අත්‍යාවශ්‍ය ඇමයිනෝ අම්ලය නම් කරන්න.
vi. උපන්දින උත්සවයේ දී කුඩා දරුවන්ට ලබා දිය හැකි ආහාර වර්ග දෙකක් ලියන්න.
vii. බාලම දියණියට ඇඳුම් තේරීමේදී එම ඇඳුම්වල තිබිය යුතු ලක්ෂණ දෙකක් ලියන්න.
viii. ගෘහණිය, සකස් කළ ආහාර මිලදී ගැනීමේ දී සැලකිය යුතු කරුණු දෙකක් ලියන්න.
ix. ආහාර පිළියෙල කිරීම හා පිසීමේ දී අනුගමනය කරන පියවර දෙකක් නම් කරන්න.

(ලකුණු 2x10=20)

02)
i. විසිතුරු මැහුම් ක්‍රම තුනක් ඇඳ නම් කරන්න. (ල 3)
ii. විවර පියවීමේ ක්‍රම තුනක් නම් කරන්න. (ල 3)
iii. ඔබ නිර්මානය කළ ලිපි රඳවනයේ
A- අද්දර නිම කිරීමේ ක්‍රමය නම් කරන්න.
B- ලිපි රඳවනය එල්ලා තැබීමට භාවිතා කළ උපක්‍රමය කුමක්ද?
C- ක්විල්ට් කිරීමට යොදා ගත් මැහුම් ක්‍රමය කුමක්ද?
D- මැසීම සඳහා යොදා ගත් මූලික මැහුම් ක්‍රමයක් නම් කරන්න. (ල 4)

03)
i. කපු කෙඳි හඳුනා ගැනීමට සිදුකරන සරල පරීක්ෂණ තුනක් ලියන්න. (ල 3)
ii. (අ) ළදරු ඇඳුමෙහි පතරොමෙහි දැක්වෙන වක්‍ර මිම් තුනක් නම් කරන්න. (ල 1 ½)
(ආ)ළදරු ඇඳුමට රෙදි මිළදී ගැනීමේ දී එම රෙදි වල තිබිය හැකි දෝෂ තුනක් නම් කරන්න.(ල 1 ½ )
iii. ළදරු ඇඳුමේ පතරොම තබා රෙදි කැපීමේ දී රෙදි පිරිමැසෙන ආකාරයට රෙද්ද මත පතරොම දිග හැර තබන ආකාරය නම් කළ රූප සටහනකින් දක්වන්න. (ල 4)

04)

i. (අ) ආහාර කාණ්ඩ තුනක් නම් කරන්න. (ල ½x3)

(ආ) එක් එක් ආහාර කාණ්ඩයට අයත් ආහාර එක බැගින් ලියා දක්වන්න. (ල ½x3)

ii. කාබෝහයිඩ්‍රේට් වර්ගීකරණය දක්වන්න. (සැකරයිඩ වර්ග හා ඒවායේ අණුක සූත්‍ර පමණක් දැක්වීම ප්‍රමාණවත් වේ.) (ල 3)

iii. (අ) ජලය හා තන්තු මගින් සිරුරට සිදුවන මෙහෙය බැගින් ලියන්න. (ල 2)

(ආ) 'ආහාර' යන්න නිර්වචනය කරන්න. (ල 4)

05)

i. (අ) මාළු තෝරා ගැනීමේදී සැලකිලිමත් විය යුතු ගුණාත්මක ලක්ෂණ දෙකක් ලියා දක්වන්න.(ල 2)

(ආ)මාළු තෙල්වල අඩංගු මේද අම්ලය නම් කරන්න. (ල 1)

ii. (අ) ඔබේ පවුලේ දිවා ආහාරය සඳහා සුදුසු බොජුන් පතක් ලියන්න. (ල 1½)

(ආ)එම බොජුන් පතට ඇතුළත් කළ ආහාර වර්ග තුනක අඩංගු ප්‍රධාන පෝෂ්‍ය පදර්ථය නම් කරන්න. (ල 1½)

iii. (අ) පහත සඳහන් ආහාර පිළියෙල කිරීමේ ශිල්පීය ක්‍රමය ලියා දක්වන්න.

a) මාළු පාන් සෑදීම සඳහා පිටි මෝලිය සැකසීම.

b) එළවළු සලාදය සඳහා කැරට් කැපීම.

c) මාළු පිසීම සඳහා රසකාරක යොදා පැය ½ - 1 ක් පමණ තැබීම.

d) පෑන් කේක් මිශ්‍රණය සෑදීම

(ල ½x4=2)

(ආ) පිපුම් කාරක දෙකක් නම් කරන්න. (ල 1)

(ඉ) තාප සංක්‍රාමණ ක්‍රම දෙකක් නම් කරන්න. (ල 1)

06) ආහාර පිළියෙළ කිරීම ඒ ඒ සංස්කෘතීන්ට අනුව සිදුකළ හැකිය.

i. පෙරදග සංස්කෘතීන්ට අනුව ආහාර පිළිගැන්වීම සිදුකළ හැකි ආකාර ලියා දක්වන්න. (ල 3)

ii. (අ) අපරදිග සංස්කෘතියට අනුව ආහාර මේසය සකස් කිරීමේ දී භාවිතා කරන උපකරණය හා මෙවලම් තුනක් නම් කරන්න. (ල 1 ½ )

(ආ) අපරදිග ආහාර පිළිගැන්වීමේ ක්‍රම තුනක් ලියන්න. (ල 1 ½ )

iii. (අ) ආහාර නරක් වීමට බලපාන හේතු කාණ්ඩ කරන්න. (ල 2)

(ආ)ඉන් එක් හේතුවක් උදහරණ සහිතව පැහැදිලි කරන්න. (ල 2)

07)

i. (අ) පවුලේ සාමාජිකයන් පවුළ තුළින් සපුරා ගන්නා අවශ්‍යතා තුනක් සඳහන් කරන්න. (ල 1 ½ )

(ආ)එම අවශ්‍යතා සඳහා උදහරණය බැගින් දක්වන්න. (ල 1 ½ )

ii. නිවාස සැලසුම් ඇඳීමේදී අවධානය යොමු කළ යුතු කරුණු කීපයකි. ඒවා අතරින්

(අ) පරිමාණය දක්වන ක්‍රම මොනවාද?

(ආ)නිවාස සැලසුම් ඇඳීමේදී භාවිතා වන සංකේතයක් ඇඳ දක්වන්න.

(ඉ) රාශිකරණය සඳහා උදහරණයක් ලියන්න. (ල 3)

iii. (අ) ආහාර පිසීම සඳහා ගෘහණිය සතු විය යුතු මානව සම්පත් දෙකක් නම් කරන්න. (ල 2)

(ආ)පවුලකට මුදල් ආදයම් ලැබෙන ආකාර මොනවාද? (ල 2)